| 29-07-2025 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

**සාරය:** සුමිහිරි දරුවනි, ශරීරයක් තුළ ජීවාත්ම සත්ථාවක් තිබෙනවා නම් පමණයි එයට යම් වටිනාකමක් ලැබෙන්නේ. කෙසේවෙතත්, ලස්සනට සරසන්නේ ශරීරයයි, ජීවාත්මය නොවෙයි.

**ප්‍රශ්නය:** ඔය දරුවන්ගේ රාජකාරිය කුමක්ද? ඔබ විසින් කළ යුතු සේවය කුමක්ද?

**පිළිතුර:** ඔබගේ රාජකාරිය වන්නේ සාමාන්‍ය කාන්තාවකගෙන් හෝ පිරිමියෙකුගෙන් තමන් ලක්ෂ්මි හෝ නාරායන වන්නේ කෙසේදැයි කියා ඔබගේම සමගාමීන්ට පෙන්වා දීමයි. ඔබ දැන් භාරතයේ සැබෑ ආධ්‍යාත්මික සේවය කළ යුතුයි. ඔබ සෑම කෙනෙක්ම ඥානය නම් වූ තෙවන ඇස ලබා තිබෙනවා. එමනිසා, ඔබගේ බුද්ධියත් හැසිරීම් රටාවත් ඉතාමත් ශිෂ්ඨ සම්පන්න විය යුතුයි. කිසිම කෙනෙක් සමඟ සුළු බැඳීමක්වත් නොතිබිය යුතුයි.

**ගීතය:** අන්ධයින්ට මඟ පෙන්වනු මැන ස්වාමීනි!

ඕම් ශාන්ති. ඩබල් ඕම් ශාන්ති. ඔය දරුවනුත් එවිට ඕම් ශාන්ති කියා ප්‍රතිචාර දැක්විය යුතුයි. අපේ මුල්ම ධර්මතාවය සාමයයි. සාමය සොයා ගැනීමට ඔබ වෙන කොහේවත් යන්නේ නැහැ. සිතේ සාමය ලබා ගැනීමට මිනිස්සු සාදු සන්‍යාසීවරුන් ළඟට යනවා. කෙසේවෙතත්, මනස හා බුද්ධිය ජීවාත්ම සත්තාවේ ඉන්ද්‍රියනුයි. මෙම ඉන්ද්‍රියන් ශාරීරික ඉන්ද්‍රියන් වන්නාක් සේ මනස හා බුද්ධියත් මෙම ඇසත් ජීවාත්මයේ ඉන්ද්‍රියනුයි. මෙම ඇස භෞතික ඇස් වගේ නොවෙයි. මිනිසුන්: අහෝ දෙවියනේ අන්ධයින්ට මඟ පෙන්වනු මැන කියා කන්නලව් කරනවා. ප්‍රභූ හෝ ඊශ්වර කියා කීමෙන් කිසිම කෙනෙකුට පිය සෙනෙහසක් අත්විඳීමට හැකි වන්නේ නැහැ. දරුවන් තම පියාගෙන් උරුමයක් ලබනවා. ඔබලා දැන් මෙහි අසුන් ගෙන සිටින්නේ පියා ඉදිරිපිටයි. ඒ වගේම ඔබලා ඉගෙන ගන්නවා. ඔබට උගන්වන්නේ කවුරුන්ද, පරමාත්ම ජීවය හෝ ප්‍රභූ තමාට උගන්වනවා කියා ඔබ කියනා එකක් නැහැ. ඔබ කියන්නේ ශිව් බාබා තමන්ට උගන්වනවා කියලයි. බාබා යන වචනය ඉතාමත් සරළයි. ඒ බාප්දාදායි. ජීවයක් කියන්නේ ජීවයකටයි. ඒලෙසින්ම ඔහු පරමාත්ම ජීවයයි. ඔහු කියනවා: මම පරමාත්ම ජීවයයි. මම පරමාත්ම දෙවියනුයි ඔබගේ පරම පියායි. පසුව නාටකයට අනුව පරමාත්ම ජීවය වන මට ශිවා යන නම දී තිබෙනවා. නාටකයේ සිටිනා සෑම කෙනෙකුටම නමක් තිබිය යුතුයි. ශිවා වෙනුවෙන් දේවාලයකුත් තිබෙනවා. ඒ එක නම වෙනුවට භක්ති මාර්ගයේ මිනිසුන් බොහෝ නම් දී තිබෙනවා. ඔවුන් නොයෙකුත් වර්ගයේ දේවාල සාදනවා. නමුත් ඔහු ඒ එකම එක කෙනායි. සෝමනාථ දේවාලය ඉතාමත් විශාලයි. එය ඉතාමත් ඉහළින් සරසා තිබෙනවා. මාළිගා ආදියත් ඉහළින්ම සරසනවා. ජීවාත්මයන් සැරසිය නොහැක්කාක් සේ පරමාත්ම ජීවයවත් සරසන්න බැහැ. ඔහු තිතක් පමණයි. සියළුම සැරසිලි ශරීරයටයි. පරමාත්ම පියා කියනවා: මාව සරසවන්නේත් නැහැ ජීවයන්ව සරසවන්නේත් නැහැ. ජීව සෑම කෙනෙක්ම තිත් පමණයි. එවන් කුඩා තිතකට චරිතයක් රඟදැක්විය නොහැකියි. කුඩා ජීවාත්මයක් ශරීරයකට ඇතුළු වුණු විට එම ශරීරය නොයෙකුත් දේ වලින් සරසනවා. මිනිසුන්ට නම් රුසක් තිබෙනවා. රජවරුන් හා රැජිණියන් එක් එක් ආකාරයෙන් සරසනවා. ජීවාත්මයන් ඉතාමත් සරළ තිත් පමණි. ඥානය ධාරණය කර ගන්නේ ජීවයයි කියා ඔය දරුවන්ට දැන් අවබෝධ වී තිබෙනවා. පරමාත්ම පියා කියනවා: මටත් ඥානය තිබෙනවා. ශරීරයට ඥානයක් නැහැ. මම වන ජීවාත්මයට ඥානය තිබෙනවා. ඔබට මෙම ඥානය කියා දීමට මට ශරීරයක් ගැනීමට සිදුවෙනවා. ශරීරයකින් තොරව එයට ඇහුම් කන් දෙන්න බැහැ. අන්ධයින්ට මග පෙන්වනු මැන ස්වාමීනී කියා ගීතයක් නිර්මාණය වී තිබෙනවා. ඒ මාවත පෙන්විය යුත්තේ ශරීරයටද? නැහැ කියා ගීතයක් නිර්මාණය වී තිබෙනවා. ඒ මාවත පෙන්විය යුත්තේ ශරීරයටද? නැහැ. මාර්ගය පෙන්වා දිය යුත්තේ ජීවයටයි. කන්නලව් කරන්නේ ජීවයයි. ශරීරයට ඇස් දෙකක් තිබෙනවා. තුනක් තිබෙන්න බැහැ. තෙවෙනි ඇස නිරූපනය කරන්නේ නළල මැද තබනා තිලකයකින්. ඇතැම් අය තිතක් තබන අතර අනිත් අය ඉරක් අඳිනවා. තිතෙන් අදහස් වන්නේ ජීවයයි. ඔබ සෑම කෙනෙකුටම ඥාන ඇසක් ලැබෙනවා. මීට පෙර ඔය ජීව කිසිම කෙනෙක් ඥානය නමැති තෙවෙනි ඇස ලබා තිබුණේ නැහැ. කිසිම මනුෂ්‍යයෙකුට මෙම ඥානය නැහැ. මෙන්න මේ නිසා තමයි ඔවුන් ඥාන ඇස නොමැත්තන් කියා හඳුන්වන්නේ. සෑම කෙනෙකුටම භෞතික ඇස් තිබුණා වුවත්, ලෝකයේ සිටිනා කිසිම කෙනෙකුට තෙවෙනි ඇසක් නැහැ. ඔබ තමයි උසස්ම උසස් බ්‍රාහ්මණ වංශය. භක්ති මාර්ගයත් ඥාන මාර්ගයත් අතර කෙතරම් වෙනසක් තිබෙනවා දැයි කියා ඔබ

දන්නවා. නිර්මාපකයාත් නිර්මාණයේ මුල, මැද හා අග ගැනත් දැන ගැනීමෙන් ඔබ ගෝලය පාලනය කරන්නන් වෙනවා. ඉන්දියානු සිවිල් සේවය සඳහා ඉගෙන ගන්නා අය රාජ්‍ය නිලතල ලබාවි. නමුත් ඉගෙනීමෙන් ඔබ පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් වන්නේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කරන්නේ ඡන්දයකින් ලබා ගන්නා මනාප ප්‍රමාණයේ තරමට. ඔය ජීවාත්මයන් දැන් පරමාත්ම පියාගෙන් ශ්‍රීමත් ලබනවා. මම ජීවත්මයන්ට උපදෙස් දෙනවා කියා කිසිම කෙනෙකුට කිව නොහැකියි. ඒ සෑම කෙනෙක්ම ශාරීරික අවධානයෙන් සිටින්නනුයි. ජීව අවධානයට පත් වීම කියා දෙන්නේ පරමාත්ම පියා පැමිණ පමණයි. අන් සෑම කෙනෙක්ම සිටින්නේ ශාරීරික අවධානයෙනුයි. මිනිසුන් තම ශරීර ගැන හරියට ආඩම්බර වෙනවා. මෙහි පරමාත්ම පියා බලන්නේ ජීවයන් දෙස පමණයි. ශරීර විනාශ වන සුළුයි. පැන්සයක් තරම්වත් වටින්නේ නැහැ. සතෙකුගේ නම් සමවත් විකුණා ගත හැකියි. මිනිසුන්ගේ ශරීර වලින් කිසිම ප්‍රයෝජනයක් නැහැ. පරමාත්ම පියා පැමිණ දැන් ඔබව පවුමක් තරම් වටිනා අය බවට පත් කරවනවා. තමන් දැන් දේවතාවරුන් බවට පත් වෙමින් සිටිනවා කියා ඔය දරුවන් දන්නවා. එමනිසා, ඒ පිළිබඳ ඔබ තුළ කුල්මත් බවක් තිබිය යුතුයි. කෙසේවෙතත්, ඔබ එකිනෙකා දරණ උත්සාහයේ තරමට තමයි ඔබගේ කුල්මත් බවත් ඉහළ යන්නේ. මිනිසුන් ධනයටත් මත් වෙනවා. ඔය දරුවන් දැන් ඉතාමත් ධනවත් වෙමින් සිටිනවා: ඔබලා විශාල ආදායමක් උපයා ගන්නවා. එක් එක් ක්‍රම වලින් ඔබලාගේ ගුණ වර්ණනා කෙරෙනවා. ඔබ සාදන්නේ මල් වත්තක්. ස්වර්ණමය යුගය හඳුන්වන්නේ මල් වත්තක් ලෙසයි. ඒ පැළ පැළ කෙරෙන්නේ කවදාදැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. පරමාත්ම පියා ඔබට උගන්වනවා. වතුහිමියනි, පැමිණෙන්න කියා මිනිස්සු කතා කරනවා. ඔහුට උයන්පල්ලෙක් කියා කියන්නේ නැහැ. මධ්‍යස්ථාන බලා ගන්නා ඔය දරුවන් තමයි උයන් පල්ලන් කියන්නේ. එක් එක් වර්ගයේ උයන් පාලකයින් සිටිනවා. ගෙවතු හිමියන් සිටින්නේ එකම එක්කෙනයි. මෝගල් වත්තේ උයන්පාලකයාට විශාල වැටුපක් ලැබෙනවා ඇති. ඔහු ඉතාමත් ලස්සන ගෙවතු නිර්මාණය කර තිබෙනවා. සෑම කෙනෙක්ම ඒවා බැලීමට පැමිණෙනවා. මෝගල්වරුන් ඒවාට ඉතාමත් කැමතියි. සාහජහාන්ගේ බිරිඳ මිය ගිය විට ඇය සිහි වීමට ඔහු ටජ්මහල සෑදුවා. ඔවුන්ගේ නම් තවමත් මතක් කරනවා. ඔවුන් එතරම් ලස්සන සිහිවටන සාදා තිබෙනවා. ඉතින් ඒ නිසා තමයි පියා කියන්නේ මිනිසුන්ව බොහෝ සෙයින් ප්‍රශංසාවට ලක් වී තිබෙනවා. මිනිස්සු මිනිස්සුයි. යුද්ධයේදී බොහෝ මිනිසුන් මිය ඇදෙනවා. පසුව ඔවුන්ට කරන්නේ කුමක්ද? ඒ සෑම මෘත ශරීරයකටම ඉන්ධන ගසා පුළුස්සා දමනවා. ඇතැම් ශරීර එහෙමම තිබෙනවා: පිළිස්සෙන්නේ නැහැ: කිසිම ගෞරවයක් නැහැ. නාරායන්වරයෙක් වීමේ සතුට ඔය දරුවන් තුළ දැන් තිබිය යුතුයි. ලෝක පාලකවරයෙක් වීමේ සතුට එයයි. සත්‍ය නාරායන්ගේ කතාව මෙයයි. එමනිසා, ඔබ අනිවාර්යෙන්ම නාරායන් වේවි. එය දෙන්නේ පරමාත්ම පියායි. තෙවෙනි ඇසේ කතාවත් තිබෙනවා. මේ සියලුම කතාන්දර වල අර්ථය පියා පැහැදිලි කර කියා දෙනවා. ඒ කතාන්දර කියනා අය ඒවායේ අර්ථය දන්නේ නැහැ. ඔවුන් අමරණීයත්වයේ කතාවත් කියනවා. ඔවුන් අමරනාථය වැනි දුර බැහැර තැන් වලටත් යනවා. පරමාත්ම පියා පැමිණ ඔබට මෙම කතාන්දරය කියා දෙනවා. ඔහු ඉහළ සිට මේවා කියා යන්නේ නැහැ. ඔහු උඩ ඉඳගෙන අමරනීයත්වයේ කතාව පාර්වතීට කිව්වා නොවෙයි. ඒ ගොතා ඇති සෑම භක්ති කාන්දරයක්ම නාටකයේ නියමිතව තිබෙනා ඒවායි. නැවතත් එය එසේම සිදුවේවි. පරමාත්ම පියා මෙහි සිට ඔය දරුවන්ට භක්තියේත් ඥානයේත් වෙනස පෙන්වා දෙනවා. ඔබ සෑම කෙනෙකුටම ඥානයේ තෙවෙනි ඇස ලැබී තිබෙනවා. ඔවුන් කියනවා: අහෝ දෙවියනේ අන්ධයින්ට මඟ පෙන්වනු මැන. භක්ති මාර්ගයේදී ඔවුන් එලෙස කන්නලව් කරනවා. පරමාත්ම පියා පැමිණ ඔබ සෑම කෙනෙකුටම තෙවෙනි ඇසක් ලබා දෙනවා. ඔබ හැරෙන්න වෙන කිසිම කෙනෙක් මේ ගැන දන්නේ නැහැ. ඥානය නම් වූ තෙවෙනි ඇස නොමැත්තන්ව අකැස් කියා හෝ අර්ධ අන්ධ කියා කියනවා. මිනිසුන්ගේ ඇස් එකිනෙකට වෙනස්. ඇතැම් අයගේ ඇස් හරිම ලස්සනයි. ඔවුන්ගේ එම ලස්සනට තෑගිත් දෙනවා. ඔවුන්ව Miss India කියා හෝ Miss so-and-so කියා හඳුන්වනවා. බලන්න ඔබ සිටි තත්ත්වයෙන් පියා ඔබව පත් කරවන්නේ කුමන තත්වයකට ද කියලා. එහි ඇත්තේ ස්වභාවික ලස්සනක්. ඇයි ක්‍රිෂ්ණාව එතරම් වර්ණනා කෙරෙන්නේ? මන්ද ඔහු තමයි සියල්ලටම වඩා ලස්සනම ලස්සන වෙන කෙනා. ඔහු අංක එකේ කර්මතීත් තත්ත්වය දිනා ගන්නවා. මෙන්න මේ නිසා තමයි ඔහුගේ වර්ණනාව ඉහළම ඉහළ වන්නේ. පරමාත්ම පියා මෙහි සිට මේ සියල්ල ඔබට පහදා දෙනවා. පරමාත්ම පියා නැවත නැවතත් කියනවා: දරුවනි, මන්මනාභව, ජීවයනි, ඔබගේ පරම පියාව සිහි කරන්න. ඔය දරුවන් අතරිනුත් එය ඇත්තේ එක් එක් මට්ටම් වලිනුයි. උදාහරණයක් ලෙස කිවහොත්, පියෙකුට දරුවන් පස්දෙනෙක් සිටියහොත් එක් අයෙක් වඩාත් ඥානවන්ත නම් ඔහු අංක එකේ දරුවා වෙනවා. ඔවුන් මාලයක පබළු වගේ වේවි. මේ දෙවැන්නා මේ තුන්වැන්නා කියා ඔහු එක් එක් අයව පෙන්වාවි. ඒ සෑම කෙනෙක්ම කවදාවත් එකම වගේ වෙන්න බැහැ. පියාගේ සෙනෙහසත් ඒ එක් එක් අයට

එක් එක් මට්ටමින් විය හැකියි. එය සීමිත කරුණක්. මෙහි ඇත්තේ අසීමිතත්වය සම්බන්ධ කරුණක්. ඥානය නම් වූ තෙවෙනි ඇස ලැබී ඇති දරුවන්ගේ හැසිරීම් රටාව හා බුද්ධිය ඉතාමත් ශිෂ්ඨ සම්පන්න වේ. රජ මලක් තිබෙනවා. ඒ වගේම මේ බ්‍රහ්මා හා සරස්වතී තමයි මල් රජ හා රැජින වන්නේ. ඔවුන් ඥානයෙනුත් යෝගාවෙනුත් දක්ෂයි. තමන් දැන් දේවතාවරුන් වෙමින් සිටිනවා කියා ඔබලා දන්නවා. ප්‍රධාන අට දෙනා අෂ්ඨරත්නය වෙනවා. පළමුවෙන්ම, මුල් පුරුක, මල, පසුව බ්‍රහ්ම හා සරස්වතී ද්විත්වය. මිනිස්සු මාලයක පබළු ගණිනවා. ඇත්තටම කියනවා නම් ඔබලා වන්දනාවට ලක් වන්නේ නැහැ: ඔබලාව සිහි කෙරෙනවා පමණයි. ඔබලා වෙනුවෙන් මල් පූජා නොකළ යුතුයි. මල් පූජා කළ හැක්කේ පිරිසිඳු ශරීර ඇති විටෙක පමණයි. මෙහි සිටිනා කිසිම කෙනෙකුට පිරිසිඳු ශරීර නැහැ. සැම කෙනෙක්ම ඉපදී ඇත්තේ පාපයෙන්. මෙන්න මේ නිසා තමයි ඔවුන් පාපකාරියි කියා කියන්නේ. ලක්ෂ්මී හා නාරායන් මුළුමනින්ම පාපයෙන් තොර අය ලෙස හඳුන්වනවා. එහිදීත් දරුවන් බිහි වෙනවා: නළ දරුවන් නොවෙයි. මේ කරුණු සියල්ලක්ම තේරුම් ගත යුතුයි. ඔය දරුවන්ව දින හතක බත්තියක අසුන් ගන්වනවා. ඇතැම් ගඩොල් පෝරණුවේ දී ඉතාමත් හොඳින් පිළිස්සී ශක්තිමත් වෙනවා. අනිත් ඒවා දුබලයි. පෝරණුවක උදාහරණය දී තිබෙනවා. පෝරණුවක පිළිස්සෙන ගඩොල් ගැන ග්‍රන්ථයක සඳහන් කරන්නේ කෙසේද? ඒ වගේම පූස් පැටවුන්ගේ කතාවත් තිබෙනවා. එවන් බළලෙක් ගැන කියැවෙන ගුල් බකාවලී කතාවත් තිබෙනවා. ඒ බළලා පහන නිවනවාලු. ඔබටත් සිදුවන්නේ එයමයි. බළල් මායා ඔබට බාධක ගෙන එනවා. ඇය ඔබව වට්ටනවා. පළවෙනිම අංකය ශාරීරික අවධානයයි. විශාල බැඳීමකුත් තිබෙනවා. දියණියක් කියාවි: භාරතය දෙව්ලොව කිරීමේ සේවය කිරීමට මම යනවා කියා. කෙසේවෙතත්, බැඳීම නිසා ඇයගේ දෙමාපියන් කියාවි: අපි ඔබට යන්න දෙන්නේ නැහැ. මහා විශාල බැඳීමක්. ඔබ බැඳීමෙන් බැඳුණු පූසෙක් නොවිය යුතුයි. සාමාන්‍ය තත්ත්වයේ සිටිනා ඔබව පියා පැමිණ දේවතාවරයෙක් කරවනවා. සාමාන්‍ය මිනිසෙක්ව නාරායන් කරනවා. මේ ඔබගේ අරමුණ හා ඉලක්කයි. ඔබගේ රාජකාරිය තම සමගාමීන්ටත් භාරතයටත් සේවය කිරීමයි. තමන් සිටියේ කෙසේද දැන් පත්ව ඇත්තේ කුමන තත්ත්වයකට ද කියා ඔබ දන්නවා. දැන් නැවතත් වතාවක් රජවරුන්ගේත් රජෙක් වීමට උත්සාහ දරන්න. ඔබ දැන් තමන්ගේම අධිරාජ්‍යය ස්ථාපනය කරමින් සිටිනා බව ඔබ දන්නවා මෙහි කිසිම අපහසුතාවයක් නැහැ. විනාශය සිදුවන ආකාරය නාටකයේ නිර්මාණය වී ඇත්තක්. මීට පෙර මිසයිල යුද්ධයක් තිබුණා. ඔබගේ සියල්ල සූදානම් වුණු විට හා ඔබ සැම කෙනෙක්ම මල් වුණු විට විනාශය සිදු වේවි. කෙනෙක් රජ මලක් වන අතර අනිත් අය රෝස හෝ පිච්ච මල් වෙනවා. තමන් අක් මලක් ද නැතිනම් වෙනත් වර්ගයක මලක් ද කියා ඔබටම තේරුම් ගත හැකියි. කිසිම ඥාන කරුණක් ධාරණය කරගත නොහැකිව සිටිනා අයත් රාශියක් සිටිනවා. සැම කෙනෙක්ම සිටින්නේ එක් එක් මට්ටම් වලයි: ඉහළම ඉහළ තත්ත්වයෙන් ඔවුන් පහළම පහළ තත්ත්වයට පත් වේවි. අධිරාජ්‍යය නිර්මාණය වන්නේ මෙහිදියි. ග්‍රන්ථ වලත් පාන්ඩවයින් දියවී යන ආකාරය පෙන්වා තිබෙනවා. ඉන් අනතුරුව සිදු වූයේ කෙසේද කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. කතාන්දර රැසක් ලියා තිබෙනවා. නමුත් එවන් දෙයක් සැබවින්ම සිදු වුණේ නැහැ. ඔය දරුවන්ගේ බුද්ධිය දැන් ඉතාමත් පිරිසිඳු වෙමින් පවතිනවා. බාබා එක් එක් ක්‍රම වලින් ඔබට නොකඩවා කරුණු පැහැදිලි කර කියා දෙනවා. එය ඉතාමත් පහසුයි. නිකම් පියාවත් උරුමයත් සිහි කරන්න. පරමාත්ම පියා කියනවා: පාරිශුද්ධකරු වන්නේ මා පමණයි. ඔබත් ඔබගේ ශරීරයත් දෙකම අපිරිසිඳුයි. ඔබ දැන් පාරිශුද්ධ විය යුතුයි. ජීවයක් පාරිශුද්ධ වුණු විට ශරීරයත් පාරිශුද්ධ වෙනවා. ඔබ විශාල උත්සාහයක් දැරිය යුතුයි. පරමාත්ම පියා කියනවා: ඇතැම් දරුවන් ඉතාමත් දුර්වලයි. ඔවුන්ට පියාව සිහි කිරීමට අමතක වෙනවා. බාබා කියන්නේ තමන්ගේම කතාවයි: කෑම කන ගමන් මට කවන්නේ ශිව බාබායි කියා මතක් වෙනවා. ටික වේලාවකින් එය අමතක වී නැවතත් මතක් වෙන්න පටන් ගන්නවා. ඔබලාත් ඔබ දරණ උත්සාහයේ තරමට එක් එක් මට්ටම් වලයි සිටින්නේ. ඇතැම් අය බන්ධන වලින් මිදුණු අය වුණත් ආයිත් ගිහින් පැටලෙනවා. දරුවන්ව හදා ගැනීමටත් ගන්නවා. ඥානය නමැති තෙවෙනි ඇස ඔබට දෙන පරමාත්ම පියාව ඔය දරුවන් දැන් සොයා ගෙන සිටිනවා. ඔවුන් මෙය සඳහන් කර ඇත්තේ තෙවෙනි ඇස ලැබීමේ කතාව ලෙසිනුයි. ඔබලා දැන් අදේවවාදීන්ගෙන් දේවවාදීන් බවට පත් වෙමින් සිටිනවා. පරමාත්ම පියා තිතක් කියා ඔය දරුවන් දැන් දන්නවා. ඔහු ඥාන සාගරයයි. ඔහුට නමක් රූපයක් නැහැයි කියා මිනිස්සු කියනවා. ඔහෝ. ඔහු ඥාන සාගරය වන නිසා අනිවාර්යෙන්ම ඔහු දැනුම දෙන්නා වේවි. ඔහුගේ රූපයත් පෙන්වා ඇත්තේ ඕවලාකාරවයි. ඉතින් එහෙම නම් ඔහුට නමක් රූපයක් නැහැයි කියා කියන්නේ කෙසේද? ඔහුට නම් දාස් ගණනක්දී තිබෙනවා. මේ සියලුම ඥාන කරුණු ඔබගේ සිහියේ ඉතාමත් හොඳින් පිහිටිය යුතුයි. ඥාන සාගරය වන්නේ පරමාත්ම දෙවියන් කියා සඳහන් කර තිබෙනවා. මුලු වනාන්තරයම පෑන්කරවා, මුළු සාගරයම තීන්ත කරවා ලිව්වත් මෙම ඥානය ලියා අවසන් කළ නොහැකියි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදැසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරමාත්ම පියා විසින් දැන් අපව පවුමක් තරම් වටිනා අය බවට පත් කරවා තිබෙනවා. අපි දේවතාවරුන් වීමට යනවා. එමනිසා, නාරායන මෙන් වීමේ කුල්මත් බවින් සිටින්න. බැඳීමෙන් මිදී සේවය කරන්න. කිසිම බන්ධනයක බැඳෙන්න එපා.
2. ඥානයෙන් හා යෝගාවෙන් දක්ෂ වී මව හා පියා සේ මල් අතර රාජිණියක් වන්න. ඒ වගේම ඔබගේ සමගාමින්ට සේවය කරන්න.

**වරදානය:** සියලු ජීවාත්මයන්ට සේවය කිරීමට ඔබගේ සියලු සම්පත් භාවිතා කිරීමෙන්, ඔබ සහයෝගී වී, ඒ අනුව සහජ යෝගීවරයෙක් වේවා.
සහජ යෝගීවරයෙක් වීමේ ක්‍රමය වන්නේ, තමන් සේවාධාරියෙක් බව සලකා, සියලු සිතිවිලි,වදන් සහ ක්‍රියා තුළින් ලෝකයේ සියලු ජීවාත්මයන්ට සේවය කිරීම සහ සෑම දෙයක්ම සේවය වෙනුවෙන් භාවිතා කිරීමයි. මේ බ්‍රහ්මින් දිවියේ ඔබට පියාගෙන් ලැබී ඇති සියලු බල, ගුණදම්, මෙම දැනුම සහ ශ්‍රේෂ්ඨ ආදායමක් උපයා ගැනීමේ කාලය යන සම්පත්, ඒ සියල්ල සේවය වෙනුවෙන් භාවිතා කරන්න, එනම්, සහයෝගී වන්න, එවිට ඔබ සහජ යෝගීවරයෙක් වෙයි. කෙසේවෙතත්, සහයෝගී වීමට හැකි වන්නේ පිරී ඇති අයට පමණයි. එබැවින් සහයෝගී වීම යනු, මහා දානපතියෙක් වීමය.

**පාඨය:** අසීමිත නිරාශාව ඇති අයෙක් වන්න, එවිට ආකර්ෂණය වීමේ සියලු සංස්කාර පහසුවෙන් අවසන් වෙයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සිතිවිලි වල බලය රැස් කරගෙන උසස් සේවය සඳහා උපකරණයක් වන්න.**

භෞතික කාර්ය සඳහා, ඔබගේ දින චර්යාවට අනුව ඔබ වැඩසටහනක් පිළියෙල කරන අන්දමින්ම, ඔබගේ මනසේ බලවත් ස්ථිතිය සඳහාද වැඩසටහනක් සාදන්න, එවිට ඔබ සිතිවිලි බලය එක්රැස් කර ගනියි. ඔබගේ මනස, ඔබ බලවත් සිතිවිලි වලින් කාර්යබහුලව තබා ගන්න තරමට, ඒ අනුව අප්සෙට් වීමට ඔබගේ මනසට කාලයක් නොතිබෙයි. ඔබගේ මනස නිරන්තරයෙන් තෘප්තව ඇති විට, එනම්, එය ඒකාග්‍රව ඇති විට, ඉබේටම යහපත් සිතිවිලි තරංග විහිදී ගොස් සේවය සිදු වෙයි.